
# ‘නිදහස් ජනතා පෙරමුණ’

07 FEB 2024

09 FEB 2024
රාජගිරිය

## ව්‍යවස්ථාව



2024 ජනවාරි 31

ආචාර්ය නාලක ගොඩහේවා
ප්‍රධාන ලේකම්
නිදහස් ජනතා පෙරමුණ

## පටුන


1. පක්ෂයේ නම

2. ලිපිනය

3. හැඳින්වීම

4. මූලික අරමුණු

5. සංවිධාන ව්‍යුහය

5.1 සාමාජිකත්වය

5.2 ශාඛා සංවිධාන

5.3 ආසන සම්බන්ධීකරණ කමිටුව

5.4 ජාතික සම්බන්ධීකරණ කමිටුව

5.5 දේශපාලන මෙහෙයුම් කමිටුව

6. පක්ෂයේ නිලධාරී මණ්ඩලය

7. පක්‍ෂයේ මහා සම්මේලනය

8. සාමාජික ගාස්තු

9. සාමාජිකත්වයෙන් ඉවත් වීම හෝ ඉවත් කිරීම

10. පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

11. විගණනය

12. නාම යෝජනා මණ්ඩලය

# නිදහස් ජනතා පෙරමුණ' පක්ෂයේ ව්‍යවස්ථාව

## 1. පක්ෂයේ නම :

නිදහස් ජනතා පෙරමුණ

## 2. ලිපිනය :

නො. 5/1, ලිබර්ටි ප්ලාසා, කොළඹ 03.

## 3. හැඳින්වීම :

නිදහස් ජනතා පෙරමුණ යනු සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් ඔබ්බට ගොස් පිරිපුන් දේශයක් ගොඩනැගීම සඳහා වූ ජනතා පෙළ ගැස්මකි. දේශපාලන සංවිධානයක් වන එය රටට ආදරය කරන ස්වාධීන මතධාරීන්ගේ එකතුවක් වන අතර පෙරමුණේ මූලික අරමුණු ප්‍රතිපත්තිවලට යටත්ව එහි සාමාජිකයන්ට ප්‍රජාතන්තවාදී රාමුවක් තුළ ස්වාධීන මත දැරීමට මෙන්ම දේශපාලන හා සමාජ ක්‍රියාකාරකම්වල යෙදීමට බාධාවක් නොමැත. රටට වැඩදායී පුරවැසියෙක්, ශක්තිමත් ආර්ථිකයක්, සැමට සාධාරණත්වය, නිසි පරිසර කළමණාකරනය හා ගුණගරුක සමාජයක් යන ප්‍රතිපත්ති කේන්ද්‍රීය කරගත් සමාජ කතිකාවක් ගොඩනගමින් සාධනීය සමාජ දේශපාලන ක්‍රියාදාමයක් හරහා සිවිල් සමාජය සන්නද්ධ කොට බලගැන්වීම මෙහි මූලික පරමාර්ථයයි. ශ්‍රී ලංකාව පිරිපුන් දේශයක් කිරීමේ පොදු අරමුණ සාක්ෂාත් කරගැනීමට තම උපරිම දායකත්වය නිදහස් ජනතා පෙරමුණ හරහා ලබාදීමට එහි සාමාජිකත්වය අපේක්ෂා කරන්නේ රටට ජාතියට ආදරය කරනා වග කිවයුතු පුරවැසියන් පිරිසක් ලෙසය. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ජාතික මැතිවරණ සඳහා තරඟ කිරීමටත් සුදුසු අවස්ථාවලදී පක්ෂයේ මූලික අරමුණු හා එකඟ වන අනෙකුත් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන්ට සහාය දීමටත් නිදහස් ජනතා පෙරමුණ ක්‍රියාකරනු ඇත.

## 4. මූලික අරමුණු

නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ මූලික අරමුණු පහත ආකාර වේ.

- ජාතික මැතිවරණ සඳහා තරඟ කර බලය ලබා ගැනීම.
- සැමට සමාන නීතියක්, පිරිසිදු නිවැරදි රාජ්‍ය පාලනයක් ඇති කිරීම.
- තිරසාර සංවර්ධනයක්, පිබිදෙන ආර්ථිකයක් බිහි කිරීම.
- නොබැඳි හා මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- සැමට නිවසක්, හිසට සෙවනක් ලබා දීම.
- නව ලොවට ගැලපෙන අධ්‍යාපනය හඳුන්වා දීම.
- නිදහස් සෞඛ්‍ය තුළින් නිරෝගීමත් සමාජයක් බිහි කිරීම.
- තිරසාර පරිසර කළමණාකරනයක් ඇති කිරීම.
- කලාව සංස්කෘතිය අගයන සංවේදී සමාජයක් බිහි කිරීම.
- ක්‍රියාශීලී හා නිරොගී තරුණ පරපුරක් ඇති කිරීම.
- දිරිලියට නිසි තැන, දරු කැලට ආරක්ෂාව ලබා දීම.
- දේශය ගොඩ නගන ආයෝජන ආකර්ෂණය කර ගැනීම.
- ජාතිවාදයෙන් මිදුණු ජාතිකත්වයක්, ආගම් වාදයෙන් මිදුණු ආගමික නිදහසක් ලබා දීම.

## 5. සංවිධාන ව්‍යූහය

නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ සංවිධාන ව්‍යූහය මූලික වශයෙන් ස්ථර 5 කින් සමන්විත වේ.

### 5.1 සාමාජිකත්වය

රටේ සංවර්ධනය හා සමාජ ප්‍රගමනය වෙනුවෙන් යම් දායකත්වයක් දැක්වීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ සමාජිකත්වය අයදුම්කල හැක.

### 5.2 ශාඛා සංවිධාන

5.2.1. නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ කුඩාම ඒකකය වන්නේ 11 දෙනෙකුට නොඅඩු පිරිසක් විසින් පිහිටුවා ගනු ලබන ග්‍රාමීය ශාඛාවකි. ශාඛාවක් පිහිටුවා ගැනීමට අවශ්‍යම වන්නේ ඒ සඳහා එකතුවන කණ්ඩායමේ අන්‍යොන්‍යතාව හා පොදු අරමුණක් වෙනුවෙන් දායක වීමට ඇති කැමැත්ත පමණි.

5.2.2 ශාඛාව අනුමත කරනු ලබන්නේ නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා හරහා ජාතික සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන යෝජනාවක් අනුමත කිරීමෙනි.

5.2.3 ශාඛාවේ නිලධාරී මණ්ඩලය 11 දෙනෙකුන්ගෙන් සමන්විත වේ.

1. ශාඛාවේ සභාපති
2. ශාඛාවේ ලේකම්
3. ශාඛාවේ භාණ්ඩාගාරික
4. ශාඛාවේ උප සභාපති
5. ශාකාවේ උප ලේකම්
6. ශාඛාවේ තරුණ හා ක්‍රීඩා කටයුතු සංවිධායක

7. ශාඛාවේ කාන්තා කටයුතු සංවිධායක
8. ශාඛාවේ ආගමික හා ප්‍රජාකටයුතු සංවිධායක
9. ශාඛාවේ රණවිරු කටයුතු සංවිධායක
10. ශාඛාවේ වෘත්තීය කටයුතු සංවිධායක
11. ශාඛාවේ ව්‍යාපාර කටයුතු සංවිධායක

5.2.4 නිලධාරී මණ්ඩලය තුළ අවම වශයෙන් එක් කාන්තා නියෝජනයක් තිබිය යුතුය.

5.2.5 ශාඛාවක් සිටිය හැකි සාමාජිකයන් ප්‍රමාණයට සීමාවක් නැති අතර අවමය 11ක් විය යුතුය.

5.2.6 සාමාජිකත්ව ප්‍රවර්ධනය සෑම ශාඛාවකම නිලධාරී මණ්ඩලයේ මූලික වගකීමක් වේ.

5.2.7 ශාඛාවේ රැස්වීම් පැවැත්වෙන වාර ගණන ශාඛාවේ නිලධාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර අවම වශයෙන් වසරකට දෙවරක්වත් රැස්විය යුතුය.

5.2.8 ශාඛා රැස්වීම කැඳවනු ලබන්නේ ශාකාවේ සභාපතිවරයා විසිනි

5.2.9 ශාඛා සාමාජිකයන් විසින් වසර 3 කට වරක් ඡන්ද විමසීමකින් නිලධාරී මණ්ඩලය පත්කරගනු ලැබේ.

5.2.10 වසර තුන අවසන් වීමට පෙර ශාඛා කමිටුව තුළ නිලධාරී තනතුරක් පුරප්පාඩු වුවහොත් ඒ තනතුර සඳහා නව නිලධාරියෙක් කමිටු සාමාජික ඡන්දයෙන් පත්කර ගත යුතුය.

## 5.3 ආසන සම්බන්ධීකරණ කමිටුව

5.3.1 මැතිවරණ බල ප්‍රදේශයක් ( ආසනයක්) තුල සිටිනා සියලුම ශාඛාවල සභාපතිවරුන් , ලේකම්වරුන්, පක්ෂය විසින් පත් කරනු ලබන ආසන සංවිධායක හා දේශපාලන මෙහෙයුම් කමිටුවෙහි අනුමැතියෙන් පත්කරන සාමාජිකයන්ගෙන් ආසන සම්බන්ධීකරණ කමිටුව සමන්විත වේ.

5.3.2 පක්ෂ ක්‍රියාකාරීන්ගේ හා පක්ෂයට හිතවත් සමාජය පිලිගත් මතධාරීන්ගේ නිර්දේශ පදනම්ව, දේශපාලන මෙහෙයුම් කමිටුවේ උපදෙස් මත පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් සෑම ආසනයකම සංවිධායකවරයා පත්කරනු ලැබේ

5.3.3 ආසන සංවිධායකවරයා පත්කිරීමේ මෙන්ම ඉවත් කිරීමේ බලය පක්ෂය සතුවන අතර අදාල තීරණය දේශපාලන මෙහෙයුම් කමිටුවෙහි උපදෙස් මත පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

5.3.4 ආසන සංවිධායකවරයා නිලබලයෙන් ආසන සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස පත්වේ.

5.3.5 ආසන සම්බන්ධීකරණ කමිටුව තුළද 11 දෙනෙකුගෙන් සමන්විත නිලධාරී මණ්ඩලයක් සිටිය යුතුය

1. ආසනයේ සභාපති
2. ආසනයේ ලේකම්
3. ආසනයේ භාණ්ඩාගාරික
4. ආසනයේ උප සභාපති
5. ආසනයේ උප ලේකම්
6. ආසනයේ තරුණ හා ක්‍රීඩා කටයුතු සංවිධායක
7. ආසනයේ කාන්තා කටයුතු සංවිධායක
8. ආසනයේ ආගමික හා ප්‍රජා කටයුතු සංවිධායක
9. ආසනයේ රණවිරු කටයුතු සංවිධායක
10. ආසනයේ වෘත්තීය කටයුතු සංවිධායක
11. ආසනයේ ව්‍යාපාර කටයුතු සංවිධායක

5.3.6 නිලධාරී මණ්ඩලය තුළ අවම වශයෙන් එක් කාන්තා නියෝජනයක් තිබිය යුතුය.

5.3.7 නිල බලයෙන් පත්වන සභාපතිවරයා හැර ආසන සම්බන්ධිකරණ කමිටුවේ සෙසු නිලධාරීන් වසර 3 කට වරක් එම කමිටුවේ සාමාජිකයන් විසින් බහුතර ඡන්දයෙන් තෝරාපත් කරනු ලැබේ.

5.3.8 මෙම වසර තුනක කාලය තුළ යම් ශාඛාවක සභාපතිවරයා හෝ ලේකම්වරයා වෙනස් වූවහොත් ආදාල ශාඛාව වෙනුවෙන් ආසන සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කල හැක්කේ අළුතින් පත්වූ නිලධාරීන්ටය.

5.3.9 වසර තුනක් අවසන්වීමට පෙර ආසන සම්බන්ධීකරණ කමිටුව තුළ යම් නිලධාරි තනතුරක් පුරප්පාඩු වුවහොත් ඒ තනතුර සඳහා නව නිලධාරියෙක් කමිටු සාමාජික ඡන්දයෙන් පත්කරගත යුතුය.

එම පත්වීම ආසන සම්බන්ධීකරණ කමිටු ලේකම්වරයා විසින් කැඳවන විශේෂ රැස්වීමකදී හෝ සාමාන්‍ය සභා රැස්වීමකදී කල හැක.

5.3.10 ආසන සම්බන්ධිකරණ කමිටු රැස්වීම් පැවැත්වෙන වාර ගණන එහි නිලධාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර අවම වශයෙන් වසරකට දෙවරක්වත් කමිටුව රැස්විය යුතුය.

5.3.11 ආසන සම්බන්ධිකරණ කමිටු රැස්වීම කැඳවනු ලබන්නේ කමිටුවේ සභාපතිවරයා විසිනි

5.4 ජාතික සම්බන්ධීකරණ කමිටුව

5.4.1 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ ජාතික මට්ටමේ සියලුම ක්‍රියාකාරකම් පාලනය කරනු ලබන්නේ ජාතික සම්බන්ධීකරණ කමිටුව විසිනි.

5.4.2 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටුවේ සියලුම සාමාජිකයන් හා ආසන සංවිධායක වරුන් හා දේශපාලන මෙහෙයුම් කමිටුවේ අනුමැතියෙන් පත්කරනා ලද සාමාජිකයන්ගෙන් ජාතික සම්බන්ධීකරණ කමිටුව සමන්විත වේ

5.4.3 දේශපාලන මෙහෙයුම් කමිටුවේ අනුමැතියෙන් ජාතික සම්බන්ධීකරණ කමිටුවට පත්කරනා ලද සාමාජිකයෙක් ඉවත් කිරීමේ බලය දේශපාලන මෙහෙයුම් කමිටුව සතුවන අතර එය දේශපාලන මෙහෙයුම් කමිටුවේ උපදෙස් මත පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා හරහා ක්‍රියාත්මක වේ.

5.4 4 ජාතික සම්බන්ධීකරණ කමිටුවේ නිලධාරී මණ්ඩලය 15 දෙනෙකු වන අතර එය නිල බලයෙන් පත්වන 9 දෙනෙකු හා ඡන්දයෙන් පත්වන 6 දෙනෙකුගෙන් සමන්විත වේ..

5.4.5 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටුවේ සභාපති, උප සභාපති, ප්‍රධාන ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික, ජාතික සංවිධායක, ප්‍රචාරක ලේකම් හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් නිල බලයෙන් නිදහස් ජනතා පෙරමුණ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, උප සභාපති, ප්‍රධාන ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික, ජාතික සංවිධායක, ප්‍රචාරක ලේකම් හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් ලෙස පත් වේ.

5.4.6 මීට අමතරව ජාතික සම්බන්ධීකරණ කමිටුවට නිලධාරීන් 6 දෙනෙකු ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයන්ගේ ඡන්දයෙන් පත්කරගනු ලැබේ.

1. තරුණ හා ක්‍රීඩා කටයුතු සංවිධායක
2. කාන්තා කටයුතු සංවිධායක
3. ආගමික හා ප්‍රජා කටයුතු සංවිධායක
4. රණවිරු කටයුතු සංවිධායක
5. වෘත්තීය කටයුතු සංවිධායක
6. ව්‍යාපාර කටයුතු සංවිධායක

5.4.7 නිලධාරී මණ්ඩලය තුළ අවම වශයෙන් එක් කාන්තා නියෝජනයක් තිබිය යුතුය.

5.4.8 ජාතික සම්බන්ධිකරණ කමිටුවේ ඡන්දයෙන් පත්වන නිලධාරීන්ගේ ධූරකාලය වසර 3 කට සීමා වේ.

5.4.9 වසර තුනකට වරක් පැවැත්වෙන රැස්වීමකදී එම කමිටුවේ සාමාජිකයන් විසින් නව නිලධාරී මණ්ඩලය තෝරා පත්කරනු ලබන අතර මින් පෙර නිලතල දැරූ සාමාජිකයෙකුට නැවත එම නිලයට හෝ වෙනත් නිලයකට පත්වීමට බාධාවක් නොමැත.

5.4.10 වසර තුන අවසන්වීමට පෙර දේශපාලන මෙහෙයුම් කමිටුවේ නිලධාරී මණ්ඩලයේ වෙනසක් වුවහොත් දේශපාලන මෙහෙයුම් කමිටුවේ අදාල තනතුර සඳහා පත්වී ඇති නව නිලධාරියා ජාතික සම්බන්ධීකරණ කමිටුවේද අදාල නිලයට පත්වේ.

5.4.11 වසර තුන අවසන් වීමට පෙර ජාතික සම්බන්ධීකරණ කමිටුව තුළ නිලධාරී තනතුරක් පුරප්පාඩු වුවහොත් ඒ තනතුර සඳහා නව නිලධාරියෙක් කමිටු සාමාජික ඡන්දයෙන් පත්කර ගත යුතුය. එම තනතුර දේශපාලන කමිටුවට නිල බලයෙන් පත්වන තනතුරක් නම් පුරප්පාඩුව පිරවීම සඳහා දේශපාලන කමිටුවේ අදාල පුරප්පාඩුවට පත් වූ නව නිලධාරියා යොදවනු ඇත.

5.4.12 ජාතික සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් කැඳවනු ලබන්නේ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසිනි

5.5 දේශපාලන මෙහෙයුම් කමිටුව

5.5.1 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ ජාතික මට්ටමේ ව්‍යවස්ථාපිත හා ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් මෙන්ම පක්ෂයේ විනය සම්බන්ධයෙන් ඉහලම අධිකාරිය වන්නේ නිදහස් ජනතා පෙරමුණේ දේශපාලන මෙහෙයුම් කමිටුවයි.

5.5.2 පක්ෂයේ ඕනෑම කමිටුවක් විසින් ගන්නා ලද තීරණයක් අවලංගු කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ වෙනස් කිරීමේ අවසාන බලය දේශපාලන මෙහෙයුම් කමිටුව සතුවන අතර දේශපාලන මෙහෙයුම් කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

5.5 3 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටුව එහි ආරම්භක සභාපතිවරයා විසින් 2016 අවසන්වන විට නම්කොට තිබූ සාමාජිකයන්ගෙන් හා දේශපාලන මෙහෙයුම් කමිටුවේ බහුතර එකඟතාවයෙන් දේශපාලන මෙහෙයුම් කමිටුවට ආරාධනා ලබන සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

5.5.4 දේශපාලන මෙහෙයුම් කමිටුවට බහුතර කැමැත්ත ඇතුව ඕනෑම අවස්ථාවක නව සාමාජිකයෙකුට ආරාධනා කල හැක. එම නව සාමාජිකයාව දේශපාලන මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වයෙන් දේශපාලන මෙහෙයුම් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කල යුතුය.

5.5 5 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටු නිලධාරී මණ්ඩලය 9 දෙනෙකුගෙන් සමන්විත වේ.

5.5 6 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටුව විසින් වසර 5 කටවරක් නිලධාරී මණ්ඩලයක් පත්කරනු ලැබේ.

5.5.7 පහත දැක්වෙන නිලධාරී මණ්ඩලය නිදහස් ජනතා පෙරමුණ' පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටුවේ පොදු එකඟතාවයෙන් හෝ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබේ.

1. සභාපති
2. උප සභාපති

3. ප්‍රධාන ලේකම්
4. උප ලේකම්
5. භාණ්ඩාගාරික
6. උප භාණ්ඩාගාරික
7. ප්‍රචාරක ලේකම්
8. ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම්
9. ජාතික සංවිධායක

5.5.8 නිලධාරී මණ්ඩලය තුළ අවම වශයෙන් එක් කාන්තා නියෝජනයක් තිබිය යුතුය.

5.5.9 දේශපාලන මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් 1/3 කට නොඅඩු පිරිසක් විසින් සභාපති වරයාට ඉදිරිපත්කරන ලිඛිත ඉල්ලීමක් මත කමිටුවේ නිලධාරි මණ්ඩලය පත් කොට ඕනෑම අවස්ථාවක කැඳවන මැතිවරණයකින්ද දේශපාලන මෙහෙයුම් කමිටුවේ තනතුරු වෙනස්කල හැක. ඒ සඳහා දේශපාලන කමිටුවේ 2/3ක සණපූර්ණයක් තිබිය යුතු අතර බහුතර ඡන්දයෙන් අවශ්‍ය වෙනස්කම් කල හැක.

5.5.10 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටුවේ සියලුම සාමාජිකයන් නිලබලයෙන් ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකයන් වේ. අවම වශයෙන් වසරකට වරක්වත් සභාව රැස්විය යුතුය.

5.5.11 වසර පහ අවසන් වීමට පෙර දේශපාලන කමිටුව තුළ නිලධාරී තනතුරක් පුරප්පාඩු වුවහොත් ඒ තනතුර සඳහා නව නිලධාරියෙක් කමිටු සාමාජික ඡන්දයෙන් පත්කර ගත යුතුය.

5.5.12 දේශපාලන මෙහෙයුම් කමිටුවේ රැස්වීමක් කැඳවනු ලබන්නේ පක්ෂයේ සභාපති හෝ පක්ෂයේ ප්‍රධාන ලේකම් විසිනි

## 6. පක්ෂයේ නිලධාරී මණ්ඩලය

නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ නිලධාරී මණ්ඩලය ලෙස සැලකෙන්නේ ඉහත 5.4 හි දැක්වෙන ජාතික සම්බන්ධීකරණ කමිටුවේ නිලධාරී මණ්ඩලයයි.

## 7. පක්ෂයේ මහා සම්මේලනය

7.1 නිදහස් ජනාතා පෙරමුණ පක්ෂයේ පක්ෂයේ මහා සම්මේලනය වසර දෙකකට වරක්වත් පැවැත්විය යුතුය.

7.2 පක්ෂයේ මහා සම්මේලනය සහභාගීවී ඡන්දය භාවිත කල හැක්කේ පහත දැක්වෙන සාමාජිකයන්ටය.

1. දේශපාලන මෙහෙයුම් කමිටු සාමාජිකයන්
2. ජාතික සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන්
3. ආසන සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන්

7.3 පක්ෂයේ මහා සම්මේලනය කැඳවීම නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් අවම වශයෙන් දින හතකට පෙර සියලුම ආසන සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් වෙත දැන්විය යුතුය. ඒ පිළිබඳව අදාල නිලධාරීන්ට දැන්වීම ආසන සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ වගකීම වේ.

7.4 පක්ෂයේ මහා සම්මේලනයට ඉදිරිපත් කරනා යම් යෝජනාවක් පක්ෂයේ සාමාජිකයන් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත්කොට සභාවේ බහුතරයෙන් සම්මත විය යුතුය.

## 8. සාමාජික ගාස්තු :

ජාතික සම්බන්ධීකරණ කමිටුව විසින් සාමාජික ගාස්තු තීරණය කල යුතුය.

## 9. සාමාජිකත්වයෙන් ඉවත් වීම හෝ ඉවත් කිරීම

9.1 සාමාජිකයෙකුට ස්වකැමැත්තෙන් ඉදිරිපත් කරනා ලිපියක් මගින් සාමාජිකත්වයෙන් ඉවත්විය හැක

9.2 නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ අරමුණු වලට හෝ ප්‍රතිපත්ති වලට පටහැනිව ක්‍රියාකරන හෝ නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ ගෞරවයට හානිවන ආකාරයට ක්‍රියාකරන සාමාජිකයෙක් විනය පරීක්ෂණයකින් පසු ඉවත් කිරීමට නිදහස් ජනතා පෙරමුණේ දේශපාලන කමිටුවට බලය තිබේ.

9.3 විනය කමිටුවක් පත්කිරීමේ බලය තිබෙන්නේ දේශපාලන මන්ඩලයටය. එය දේශපාලන මන්ඩලයේ බහුතර කැමැත්ත අනුව පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් පත් කෙරේ.

9.4 විනය පරීක්ෂණයකදී අදාල සාමාජිකයාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදිය හැකි වන අතර විනය කමිටුවේ තීරණය ජාතික සම්බන්ධීකරණ කමිටුවේ ලේකම්වරයාට යොමු කෙරේ.

9.5 විනය කඩකිරීමක් සම්බන්ධයෙන් අවසාන තීරණය දේශපාලන මෙහෙයුම් කමිටුව සතුවන අතර දේශපාලන මෙහෙයුම් කමිටුවේ තීරණය බහුතරයගේ තීරණය වේ.

## 10. පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

දේශපාලන මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් 2/3 කට නො අඩු පිරිසක් විසින් සම්මත කරනා යෝජනාවක් මත නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ ව්‍යවස්ථාව ඕනෑම අවස්ථාවක සංශෝධනය කලහැකි අතර සංශෝධනය බලාත්මක වන්නේ එය ජාතික සම්බන්ධීකරණ කමිටු රැස්වීමක බහුතර අනුමතියකින් සම්මත වූ පසුවය.

## 11. විගණනය

නිදහස් ජනතා පෙරමුණ පක්ෂයේ ගිණුම් තබා ගැනීමේ වගකීම පක්ෂයේ ලේකම් හා භාණ්ඩාගාරික සතුය. ගිණුම් වර්ෂය ලෙස සලකනු ලබන්නේ සෑම ලිත් වර්ෂයකම ජනවාරි 1 දින සිටදෙසැම්බර් 31 දක්වා කාලය වේ. පක්ෂයේ ගිණුම් ලියාපදිංචි විගනකාධිවරයෙකු ලවා විගනනය කොට වර්ෂ අවසානයෙන් පසු එළෙඹෙන පළමු මහාසභා රැස්වීමට ඉදිරිපත් කල යුතුය.

## 12. නාම යෝජනා මණ්ඩලය

පක්ෂය විසින් යම් මැතිවරණයට තරඟ කිරීමට තීරණය කල අවස්ථාවකදී පක්ෂයේ දේශපාලන මෙහෙයුම් කමිටුව විසින් නාම යෝජනා මණ්ඩලයක් පත්කල යුතු අතර, එමඟින් සුදුසු අපේක්ෂකයින් තෝරාගෙන නාම යෝජනා සකස් කරනු ලැබේ